

# ගෙවී ගිය කාලේ යළිත් නොඑ් ම ය

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

- සුමනා දේවිය නම් කුමරියගේ කථා වස්තුව
- මඛාදේව ජාතකය
- සෙනෙහෙබර ආමන්ත්‍රණය
- නිර්මාණ ඉසව්ව
- දම්සක් පැවතුම් සූත්‍රය

උත්සාහයෙන් වීර්යයෙන්...
ජීවිතය ජයගන්නට වෙර දරනා...
පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2563 | ව්‍යවහාර වර්ෂ 2020
( සැප්තැම්බර්, ඔක්තොම්බර්, නොවැම්බර්, දෙසැම්බර්)

SCO
SHRADDHA CHARITY ORGANIZATION
www.sco.lk



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා
සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන
අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර
පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහාමේඝනාව
භාවනා අසපුව

ශ්‍රද්ධා
රූපවාහිනිය

ලක්විරු
ගුවන්විදුලිය
LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

**නමෝ බුද්ධාය!**

ව්‍යවහාර වර්ෂ 2021 ක් වූ ජූලි මස 10 දින දී ය.

පින්වත් දුවේ පුතේ,

අන් අයගේ වචනවලින් සිත බිඳුනු, සිත රිදුනු අවස්ථා ඔබ කාගේත් ජීවිත තුළ ඇති. ඔබ වැනි දරුවන්ට පමණක් නොවෙයි; බොහෝ වැඩිහිටියන්ටත් මුහුණ පාන්නට සිදුවන දුෂ්කර අවස්ථාවක් තමයි නපුරු, දරුණු, සිත පීඩාවට පත් කරන වචන අසන්නට ලැබීම. බොහෝ දෙනෙකු එවැනි කර්කශ වචන ඉදිරියේ සැලෙනවා. කම්පා වෙනවා. අතිශයින් ම දුකට පත් වෙනවා. ඒක තමයි අප ලෝකයේ දකින පොදු ස්වභාවය.

පින්වත් දුවේ පුතේ, මේ ලෝකයේ අපට ඇසෙන වචනයන්ගේ ආකාරයන් පහක් ගැන සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා.

1. **කලටත්, අකලටත් කියන වචන**
2. **සත්‍යයෙනුත්, අසත්‍යයෙනුත් කියන වචන**
3. **මෘදුවත්, දරුණුවත් කියන වචන**
4. **යහපත ඇති කරන, අයහපත ඇති කරන වචන**
5. **මෙත් සිතිනුත්, ද්වේෂ සිතිනුත් කියන වචන**

ඔය මොන ආකාරයකින් කියවෙන වචනයක් ඉදිරියේ වුණත් සිත වෙනස් කර ගන්නේ නැතිව, පාපී නපුරු දරුණු වචන කියන්නේ නැතිව, හිතානුකම්පී ව, තරහව උපදවන්නේ

නැතිව ඒ වචන කියන කෙනා කෙරෙහිත් - මුළුමහත් ලෝකයා කෙරෙහිත් පුළුල් ව පැතිර ගිය, විපුල ව වැඩී ගිය මෙත් සිතින් යුතුව ඉන්නවා කියලා හික්මෙන්න කියලයි සම්බුදුරජාණන් වහන්සේ අපට අවවාද කොට වදාළේ. මේ සුන්දර දහම් පර්යාය මුණගැසෙන්නේ කකචූපම සූත්‍ර දේශනාවේ දී...

ඇත්තටම අප කොතරම් කැමති වුණත් අපට සුදුසු කාලයේ දී, සත්‍ය වූත්, මෘදු වූත්, මෙත් සිතින් කියන්නා වූත්, යහපත ඇති කරවන්නා වූත් වචන පමණක් ම සෙසු ලෝකයාගෙන් ඇසෙන්නේ නැහැ. සම්බුදුරජාණන් වහන්සේගේ අවබෝධය පරිපූර්ණ යි. ඒකාන්තයෙන් ම අපට පෙර දැක්වූ සියලු ස්වභාවයන්ගේ වචනවලට ඇහුම්කන් දෙන්නට සිදු වනවා ම යි. ඒ නිසා, අනිත් අය ගුණයන්ගෙන් වැඩී ගොස් අපට ප්‍රිය වූ සොඳුරු වචන ම පවසා අපට වචනයෙන් නොරිදවා සිටීවා යන්න ලැබිය නොහැකියි.

පිනෙන් අග්‍ර වූ, ගුණ ආකරයක් වූ, කිසිදු නුහුගුණයක් නොවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේටත් ලෝකයා නොයෙක් නින්ද අපහාස සිදු කළා. කටුක කර්කශ වචනවලින් චෝදනා කළා. ඒ තමයි ගුණයන්ගෙන් හිස් වූ ලෝකයාගේ ස්වභාවය. එහෙම එකේ අපට කටුක වචන අහන්න නොලැබී තියේවි ද? එහෙම නම් අප කළ යුත්තේ කවර වචනයක් අසන්නට ලැබුණ ද ඒ හමුවේ කැළඹෙන්නේ නැති අකම්පිත බවක් උපදවා ගැනීම නේ ද?

එයට ඉතා හොඳ ක්‍රමයක් අප ඔබට කියා දෙන්නම්. පින්වත් දුවේ පුතේ, යමෙක් ඔබට චෝදනා කරනවා නම්, ඒ අවස්ථාවල දී ඔවුන් පවසන්නේ සත්‍යයක් ද අසත්‍යයක් ද යන්න අප සිතා විමසා බැලිය යුතුයි. ඔබ තුළ පවත්නා ම

වූ නුගුණක් නිසා නම් එසේ චෝදනා කරන්නේ, ඔබ කළ යුත්තේ ඒ නුගුණින් නැගී සිටිමින් ගුණවත් බවට පත් වීම යි. ඔබ තුළ නොපවතින්නා වූ නුගුණක් කියමින් නම් ඔවුන් චෝදනා කරන්නේ, අසත්‍යයෙන් කරන චෝදනාවකට කුමට නම් කැළඹෙන්න ද? එවැනි අවස්ථාවල, නොදන චෝදනා කරමින් අකුසල් රැස් කරගෙන සසරේ දුක් විපාක උපදවනා කර්ම සිදු කරන ඔවුන් ගැන අනුකම්පාව උපදවාගෙන ඔබ ඔබ ව රැක ගන්න. එසේ නැතිව ඔවුන් ගැන ගැටෙන්නට වුවහොත්, ඔබ තුළ උපන් ද්වේෂයෙන් පළමුවෙන් දැවෙන්නේ ඔබ යි. එය දුක් විපාක උපදවන්නේ ඔබට ම යි...

සත්පුරුෂ උතුමන් ලෝකයාගේ වචන හමුවේ උදම් වූයේ නැහැ, සිතින් බිඳ වැටුණේ ද නැහැ. ඒ සත්පුරුෂ උතුමන් නිවී සැනසී වදහළ උතුම් සම්බුදු මගෙහි හික්මෙන ශ්‍රාවක දරුවන් විදිහට ඔබ අප කවුරුත් ඒ උත්තම ගුණධර්මය අප තුළත් උපදවා ගන්නට අතිශයින් කැමති විය යුතුයි.

සිතා, නොසිතා කියන වචනවලින් තැවුලට පත් නොවී ගුණධර්මයන් තුළ පිහිටමින් රැකවරණ ලබන්නට පින්වත් ඔබට ද වාසනාව උදා වේවා!

**තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


| | |
|---|---|
| 01. සුමනා දේවිය නම් කුමරියගේ කථා වස්තුව | 12 |
| 02. සෙනෙහෙබර ආමන්ත්‍රණය | 21 |
| 03. මඛාදේව ජාතකය | 27 |
| 04. ගෙවී ගිය කාලේ යළිත් නෝජ් ම ය | 34 |
| 05. නිර්මාණ ඉසව්ව | 41 |
| 06. දම්සක් පැවතුම් සූත්‍රය | 55 |

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

**(යමක වර්ගය)**

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



දහම දැකීම ම යි උතුම් වන්නේ...

# සුමනා දේවිය නම් කුමරියගේ කථා වස්තුව

## "පින් කළ කෙනා දෙලොවම සතුටු වෙයි."

පින්වතුනේ, පින්වත් දරුවනේ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුණු ඉතා සැදැහැවත් පිරිසක් එදා දඹදිව සිටියා. ඔවුන් අතරින් අනේපිඬු සිටුතුමා අග්‍ර වූ දායක පින්වතා වශයෙන් අගතනතුරු ලැබුවා. අනේපිඬු සිටුතුමාගේ කලින් නම සුදත්ත. ඔහු ඉතාමත් දක්ෂ ව්‍යාපාරිකයෙක්. දවසක් ඔහු ව්‍යාපාර කටයුතු සඳහා රජගහ නුවර බලා පිටත් වුණා. රජගහ නුවර සිටුවරයෙකුගේ නිවසක රාත්‍රී ආහාර ගෙන සතුටු සාමීචි කථාවේ යෙදී සිටියදී බුදුරජාණන් වහන්සේ ගැන අසන්නට ලැබුණා.

බුදුරජාණන් වහන්සේ යන නාමය ඇසූ පමණින්ම මේ සුදත්ත සිටුතුමා උද්දාමයට පත්වුණා. වචනයෙන් කිව නොහැකි තරම්ම ප්‍රීතියට පත්වුණා.

"හරිම දුර්ලභයි... හරිම දුර්ලභයි... ඔව් මං අහල තිබෙනවා. බුදුවරයන් වහන්සේලා පහළ වෙන්නෙ ඉතාමත් කලාතුරකින් කියලා. ඇත්තෙන්ම මට ඒ බුදුරජාණන් වහන්සේව දැකගන්න ඇත්නම්, එක බණ පදයක් හරි අහගන්න ඇත්නම්, ඊට පස්සෙ මං මළත් කමක් නැහැ."

සුදත්ත සිටුතුමා එදා තම නවාතැනට ගියේ කිව නොහැකි තරම් ප්‍රීතියකින්. ඇත්තෙන්ම එදා මෙයාට නින්ද ගියේ නැහැ. බුදු ගුණ ගැනම හිත හිතා හිටියා. රාත්‍රියේ අවදි වුණා. වටපිට බලද්දී හොඳට එළිය වැටිල වගේ පෙනුනා. මෙතුමා එළිවුනා කියල හිතාගෙන බුදුරජාණන් වහන්සේව

බැහැදකින්න පිටත් වුණා. අතරමගදි සොහොන ළඟින් ගමන් කරද්දී සිතට පොඩි බයක් ආවා. එතකොටම කළුවර වෙලා ගියා. සුදත්ත සිටුතුමාට එළිවෙලා වගේ පෙනුනේ බුදු ගුණ සිතීමෙන් සිතේ ඇතිවුණු ප්‍රසන්න බව නිසයි. නමුත් ඇත්තටම තවමත් කළුවරයි. එකවරටම කළුවර වැටුණු වෙලාවේ සුදත්ත සිටුතුමා නැවතුණා. අහසින් හඬක් ඇසුණා.

**"සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරී රථා**
**සතං කඤ්ඤා සහස්සානි - ආමුත්ත මණිකුණ්ඩලා**
**ඒකස්ස පදවීතිහාරස්ස - කලං නාග්ඝති සෝළසිං"**

සියයක් ඇතුන් ලැබුනද
- සියයක් අසුන් ලැබුණද
වෙළඹුන් යෙදූ ලස්සන
- රථ සියයකුත් ලැබුණද
මිණිකොඬොල් අභරණවලින්
- යුතු කතුන් දහසකුත් ලැබුණද
උතුම් සම්බුදු සමිඳුන්
- බැහැදකින්නට තබන පියවර
සොළොස් කලාවෙන් බෙදා බැලුවද
- එක් කලාවක් ගත්තද
එය වටිනවා හැම විට
- අර සියලු දෙයටත් වඩා

මේ හඬ ඇසෙනවාත් සමඟම සුදත්ත සිටුතුමාට ආයෙමත් බුදු ගුණ මතක් වෙන්න පටන් ගත්තා. භය නැතුව ගියා. කළුවර නැතුව ගියා. පාර තොට පැහැදිලිව පෙනෙන්න පටන් ගත්තා. ඔය විදිහට තුන් වතාවක්ම කළුවර වුණා. ඒ තුන් වතාවේම ඔය ගාථාව ඇසුණා. වේළුවනාරාමය දෙසට යද්දී බුදුරජාණන් වහන්සේ රුක් සෙවණක වැඩසිටියා. "පින්වත්

සුදත්ත, මෙහි එන්න" කියලා කරුණාවෙන් කථා කළා. සුදත්ත සිටුතුමාට හරි සතුටුයි. බුදුරජාණන් වහන්සේ තමාගේ නමින්ම අමතා කථා කළා කියලා. උන්වහන්සේ ළඟට ගිහින් බිම දිගා වෙලා වන්දනා කළා. බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය ඇසුවා. සෝවාන් ඵලයට පත් ශ්‍රාවකයෙක් බවට පත්වුණා.

ආපසු සැවැත් නුවර බලා පිටත් වුණු සුදත්ත සිටුතුමා සැවැත් නුවරට වඩින බුදුරජාණන් වහන්සේ ප්‍රධාන ශ්‍රාවක සංඝරත්නයට නිරතුරුව දන්පැන් පිදුවා. දුගී මගී අසරණ අයටත් දන්සැල් දුන්නා. මේ නිසාම මේ සුදත්ත සිටුතුමා අනේපිඬු සිටුතුමා නමින් ප්‍රසිද්ධ වුණා. පස්සෙ කාලෙක අනේපිඬු සිටුතුමා තමා පදිංචිව සිටි සැවැත් නුවරින් බුදුරජාණන් වහන්සේ උදෙසා ආරාමයක් තනවා පූජා කරන්න කල්පනා කළා. ජේත නම් කුමාරයෙකුට අයිති ඉතාම ලස්සන උද්‍යානයක් තිබෙනවා. සැවැත් නුවරට දුරත් නැහැ. ළඟත් නැහැ. නිශ්ශබ්දතාවයත් තිබෙනවා.

අනේපිඬු සිටුතුමාගේ සිත ගියේ මේ ජේත කුමාරයාගේ උද්‍යානයටමයි. ජේත කුමාරයා මේ උයනට හරි ආසයි. කිසිසේත් විකුණන්න කැමැති වුණේ නැහැ. දිනක් අනේපිඬු සිටුතුමා ජේත කුමාරයා මුණ ගැහෙන්න ගියා. උද්‍යානය විකුණනවා නේද කියලා බල කරමින් අහන්න පටන් ගත්තා. අන්තිමේදී ජේත කුමාරයා කිව්වා,

"සිටුතුමනි, ඔහොම නොවේ, මං මගේ උද්‍යානය පුරාවට රන්කාසි ඇතිරුවත් දෙන්නේ නැහැ" කියලා.

එතකොට අනේපිඬු සිටුතුමා කිව්වා,

"ජේත කුමාරයා... හරි හරි... ඔන්න එහෙනම් මං උද්‍යානය ගත්තා."

ජේත කුමාරයා මෙහෙම ඇහුවා,

"සිටුතුමනි, ඒ කොහොමද?"

"ඇයි කුමාරය, දැන් ඔබ කිව්වේ රන්කාසි ඇතිරුවත් දෙන්නෙ නැහැ කියලා. දැන් මං හෙට උදේ ඉඳලා රන්කාසි අතුරන්න පටන් ගන්නවා."

ජේත කුමාරයා විශ්වාස කළේ නැහැ. නමුත් පසුවදා උදේ බලද්දී අනේපිඬු සිටුතුමාගේ සේවකයන් කරත්තවලින් රන්කාසි පටවාගෙන ඇවිදින් ජේත කුමාරයාගේ උයනේ අතුරන්න පටන් ගත්තා. අන්තිමේදී ජේත කුමාරයාගේ උයනේ කොටසක් ඉතුරුවෙද්දී රන්කාසි ඉවර වුණා. ජේත කුමාරයා කල්පනා කළා.

'මේක නම් මහා පුදුම දෙයක්. ශ්‍රද්ධාව තියෙනවා කියලා කෙනෙකුට මෙහෙම වියදම් කරන්න පුළුවන්ද. රන්කාසි අතුරාගෙන යද්දී සිටුතුමා ප්‍රීතියෙන් සිනහ වුණා. හරිම පුදුමයි. මේ මනුස්සයාට ලෝභකම කියල දෙයක් නැද්ද? හම්බකරපු දේවල් මෙහෙම වියදම් කරන්න නම්, මීට වඩා වටිනා දෙයක් මෙයාට ලැබිලා ඇති.'

ජේත කුමාරයා අනේපිඬු සිටුතුමා ඇමතුවා,

"පින්වත් සිටුතුමනි, ඇත්තෙන්ම ඔබේ මේ පරිත්‍යාගය ගැන මට පුදුමයි. අර ඉතුරු වෙච්ච කොටසට රන්කාසි අතුරන්න ඕන නැහැ. හැබැයි මං පොඩි ඉල්ලීමක් කරන්නම්. විහාරෙ හැදුවට පස්සෙ මේ උද්‍යානයට මගේ නම දාන්න කැමැතිද?"

අනේපිඬු සිටුතුමා එයට කැමැති වුණා. ඊට පස්සේ ජේත කුමාරයාගේ වනයේ සැදූ ආරාමය යන නමින් ජේතවනාරාමය වශයෙන් හැඳින්වූවා.

අනේපිඬු සිටුතුමාගේ පවුලේ සියලු දෙනාම පාහේ මගඵල ලැබුවා. තමන්ගේ දරුවන්, ලේලිලා, බෑණලා, කවුරුත් මගඵල ලාභී ශ්‍රාවකයන් වෙනවා කියන්නේ මොන තරම් වාසනාවක්ද? අනේපිඬු සිටුතුමාට ඒ වාසනාව ලැබුනා. අනේපිඬු සිටුතුමාට දියණිවරු තුන් දෙනෙක් හිටියා. වැඩිමහළු කෙනා මහා සුභද්‍රා, මද්දුම දියණිය චුල්ල සුභද්‍රා, බාල දියණිය සුමනාදේවී.

ඉතින් මේ බාල දියණිය අසනීප වුණා. අසාධ්‍ය තත්වයට පත්වුණා. මරණාසන්න වුණා. එතකොට ඒ දියණිය මෙහෙම කල්පනා කළා.

'මේ ජීවිතය අස්ථිර දෙයක්මයි. තමන්ගේ වසඟයේ පවත්වන්න පුළුවන්කමක් නැහැ. මට මේ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරන මාර්ගයමයි දියුණු කරගන්න ඕන. ඇත්තෙන්ම මගේ පියාණන් වැඩිපුර උනන්දු වෙන්නේ දන් දීම ගැනමයි. ධර්මාවබෝධය ගැන තවත් උනන්දු කරවන්න මට පුළුවන් වුණොත් ඒක තමයි මට පියා වෙනුවෙන් දෙන්න තියෙන දේ....'

සුමනාදේවිය මෙහෙම කල්පනා කර කර සිටිද්දී අනේපිඬු සිටුතුමා තම බාල දියණියගේ රෝගාතුර වීම ගැන කණස්සල්ලෙන් වගේ එතැනට පැමිණියා. මෙහෙම ඇහුවා.

"මගේ පින්වත් දුව, සුමනා...."

"ඇයි පින්වත් මලණුවනි...?" කියලා සුමනාදේවිත් පිළිතුරු දුන්නා. මේ පිළිතුරෙන් අනේපිඬු සිටුතුමා පුදුමයෙන් වගේ තම දියණිය දෙස බලා සිටියා. දියණිය මෙසේ පවසන්නේ මක් නිසාද කියා ඔහුට තේරුණේ නැහැ.

"අනේ මගේ දුවේ, ඔයාට අසනීප තත්වය හොඳටම

වැඩියි නේද? ඒ නිසා නේද ඔයා ඔහොම දොඩන්නේ?"

එතකොට සුමනා දේවිය කිසි කලබලයක් නැතුව මේ පිළිතුර දුන්නා.

"නැහැ මළණුවනි, මං මේ අසනීපය නිසා දොඩවනවා නොවෙයි."

එහෙත් අනේපිඬු සිටුතුමාට තම දියණිය කියන දෙය තේරුනේ නැහැ.

"එතකොට පින්වත් දුවේ, ඔයා මරණයට භය නැද්ද?"

"නැහැ මලණුවනි, මං මරණයට භය කෙනෙක් නොවේ" කියලා සුමනා දේවිය දෑස් පියාගත්තා. මරණයට පත්වුණා.

සිටුතුමා මේ ගැන දිගින් දිගට කල්පනා කළා. මගේ දුව බොළඳ කෙනෙක් නොවේ. ලොකු අර්ථයක් ඇතුවයි මෙහෙම කතා කළේ. මං මේ කාරණය බුදුරජාණන් වහන්සේගෙන් අහනවා කියලා හිතා ගත්තා. සුමනා දේවියගේ අවසන් කටයුතුවලින් පස්සේ බුදුරජාණන් වහන්සේ බැහැ දකින්න ගිය අනේපිඬු සිටුතුමා මෙකරුණ සැළ කළා. බුදුරජාණන් වහන්සේ සිටුතුමාට පැහැදිලි කළා,

"පින්වත් සිටුතුමනි, ඔය සුමනා දේවිය පොඩි දැරිවියක් වුණාට ඉතාමත් ඥානවන්තයි. ඔබට කල්පනා කරන්න යමක් අවසන් මොහොතේ ලබා දුන්නා. ඇය සකදාගාමී වෙලා හිටියේ. ඔබ සෝතාපන්න වුණු කෙනෙක්. ධර්මය තුළ ඇය වැඩිමහලුයි. එය තේරුම් කර දෙන්නටයි මලණුවනි කියා ඔබව ඇමතුවේ. ඒක ඇය ආඩම්බරකමින් කළා නොවෙයි. ඔබව ධර්ම මාර්ගයෙහි උනන්දු කරවීම පිණිසයි ඇය එසේ පැවසුවේ. දැන් ඇය ඉතාම සතුටින් තුසිත දෙව්ලොව ඉපදිලා ප්‍රීතියෙන් ඉන්නවා. පින් නිසා ලබන සතුට කොතරම් සැනසිල්ලක්ද?"

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළා.

**ඉද නන්දති පෙච්ච නන්දති**
**- කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති**
**පුඤ්ඤං මේ කතන්ති නන්දති**
**- භිය්‍යෝ නන්දති සුග්ගතිං ගතෝ**

තමා විසින් රැස් කරගත්
- පින් ගැන සිහිපත් වෙන විට
සතුටු වෙවී සැප විඳිමින්
- නිතර සතුටු වෙයි එනිසා
මමත් බොහොම පින් කෙරුවා
- කියමින් තුටු වෙන මිනිසා
දෙව්ලොව සැප විඳිනා කල
- බොහෝ සතුටු වෙයි එනිසා

පින්වතුනේ, පින්වත් දරුවනේ, දෙවිවරුන් අතර මෙන්න මෙහෙම කථාබහක් වෙනවා. "අහෝ! භවත්නි, ප්‍රීතියි... ලොවට වාසනාවක්මයි. බුදු සසුන බබලන කාලවලදී දෙව්ලොව පිරී යනවා. එහෙත් භවත්නි, බුදු සසුන පිරිහී යන කාලෙට දිව්‍යලෝක දෙවිවරුන්ගෙන් හිස් වෙනවා." කියලා. මේ කියමනේ ලොකු තේරුමක් තියෙනවා. ඒ තමයි තෙරුවන් සරණ ගිය සිල්ගුණදම් රකින බොහෝ දෙනෙක් දෙව්ලොව උපදින බව. නමුත් බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නේ දෙවියන් ගැන වැරදි විදිහටයි. දිව්‍ය ලෝකවල ගිහින් වැඩක් නැහැ. පිනක් දහමක් කරන්න බැහැ. දෙවියන්ට නිවන් දකින්නත් බැහැ. මහඵල ලබන්නත් බැහැ කියලයි. මෙය ඉතාම වැරදි අදහසක්.

දැන් ඔබ දකින්න ඇති මිනිස් ලොව මගඵල ලැබූ පින්වත් උදවිය මරණින් මතු දිව්‍ය ලෝකවල උපත ලබා සැප සේ

සිටින ආකාරය. මේ ගාථාවලින් විස්තර කරන්නෙත් ඒකමයි. එහෙම නම් දිව්‍ය ලෝකයේ උපත ලැබීම ධර්මයෙහි හැසිරුණු අයට විශේෂයෙන්ම ලැබෙන දෙයක් බව අපට පෙන්නවා. දැන් මේ සුමනා දේවිය පවා තුසිත දෙවියන් අතරේ ඉපදුණා. දැන් සතුටින් කල් ගෙවනවා. සුමනා දේවිය මිනිස් ලොවදීත් සකදාගාමී තත්වයට දියුණු වෙලා හිටියා. ඇයට දෙව්ලොවදීත් ඉතුරු මාර්ගඵල දියුණු කරගන්න පුළුවන්. දෙවියන්ට මගඵල ලබන්න බැරිනම් මගඵල නොලබන ලොවක මගඵල ලාභී ශ්‍රාවකයින් උපදීවිද? මේ නිසා මේ ගැන නොදන්නා බොහෝ දෙනෙක් දෙව්ලොව උපත පවා අහිමි කරගන්නවා.

මිනිස් ලොව වුණත් යළි යළි උපදින එක දුර්ලභ දෙයක්මයි. මෙලොව පරලොව දෙකේම සතුටක් ලබන්න පුළුවන් වෙන්නේ පින් කරපු කෙනාට විතරයි. එතකොට බුදුරජාණන් වහන්සේ මේ ගාථාවෙන් පින්කරපු කෙනා හැටියට පෙන්වා වදාළේ මගඵල ලාභී ශ්‍රාවකයාව නෙවේද? ජීවිතයේ රැකවරණය පිණිස කෙනෙකුට අනුගමනය කළ හැකි එකම මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ග යයි. සීල, සමාධි, ප්‍රඥා තුළ තම නිවන් මග දියුණු කර ගැනීම සම්මා දිට්ඨියෙන් යුතු ආර්ය ශ්‍රාවකයෙකුට නිසැකවම කරන්න පුළුවන්.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*දයාබර ධනුෂ පුතු වෙත,*

*ඔබ මීට කලින් එවන ලද ලිපියක් ද ලැබුණු ප්‍රථම වාර පරීක්ෂණයේ ලකුණුත් සමඟ එය බලා මා බොහෝ සතුටු වුණා. ගෙදර දොර කටයුතු තරමක් බහුල වීම නිසා පිළිතුරු ලියන්න අතපසු වුණා. ඔබගේ උත්සාහය තවදුරටත් රැඳවාගෙන අධිෂ්ඨානයෙන් වැඩ කරගෙන යන්න. බලාපොරොත්තු සාර්ථක ලෙස ඉටු වේවා'යි මා නිතරම පතනවා.*

*මා ඉන්නේ මගේ ම දුවගේ ගෙදර. ඇයටත් මේ වසරේ ගණිත අංශයෙන් උසස් පෙළ ලියන දුවෙක් ඉන්නවා. තවත් 10, 6 ශ්‍රේණිවල දරුවන් දෙදෙනෙක් ද සිටිනවා. දුව ගම්පහ රෝහලේ රැකියාවක නිරත වෙන නිසා ගෙදර හා දරුවන්ගේ කටයුතුත් මා හට කරන්න වෙනවා. ඒ නිසයි අවිවේකය. මෙවර කොරෝනාවට පෙර ගම්පහ අසපුවේ නොයෙක් කටයුතුවලට සහභාගී වුවා.*

*පුතේ, අන්තර්ජාලය ඔස්සේ කටයුතු කර ගන්න ඔබට පහසුකම් තිබෙනවාද? ඒ සඳහා හෝ වෙනත් අවශ්‍යතාවන දෙයක් ඇත්නම් මට දන්වා එවන්න. ඔබ වැනි දක්ෂ දරුවෙකුට උපකාර කිරීම මට මහත් සතුටක්. ඉතින් ඒ සතුට, පින ලබා ගන්න අපට මහෝපකාරී වන ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු සියලු ස්වාමීන් වහන්සේලාට ද, ශ්‍රද්ධා කාර්යය මණ්ඩලයට ද අපි නිතර පුණ්‍යානුමෝදනා කරමු. පුතේ, ඔබේ පවුලේ තොරතුරු ටිකක් දැනගන්න කැමතියි. නැවත ලියන විට ලියා එවන්න. ඔබ සියලු දෙනාට ම තෙරුවන් සරණ හා දෙව් රැකවරණය පතමි.*

*තෙරුවන් සරණයි!*

*මීට කැපකරු මව....*

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහඟු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*ආදරණීය පින්වත් කැපකරු අම්මා හා තාත්තා වෙත,*

*ආදරණීය අම්මේ තාත්තේ, ඔබ දෙපලගේ සුවදුක් කෙසේ දැයි මා ප්‍රථමයෙන් ම විමසමි. වර්තමානයේ රට තුළ උද්ගතව ඇති තත්වයත් සමඟ එතරම් සුව පහසුවක් නොවන බව මා දනිමි. නමුත්, ඔබ දෙපල ඇතුළු පවුලේ සියලු දෙනාත්, අපගේ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු අසපුවේ වැඩ වසන ස්වාමීන් වහන්සේලාත්, ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව සත්කාර්යයේ නැන්දලා මාමලාත් නිදුක් නිරෝගී සුවයෙන් සිටිනවායැයි සිතමි.*

*අප රටට පමණක් නොව සමස්ත ලෝකයට ම පිළිලයක් වී ඇති කොරෝනා උවදුර නිසා අප සියලු දෙනාගේ ම ජීවිත අඩපණ වී ඇත. දෙසැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිතව පැවති සාමන්‍ය පෙළ විභාගය මාර්තු පළමුවැනිදා දක්වා දීර්ඝ විය. මේ දිනවල මා මාගේ විභාගය සඳහා සූදානම් වෙමි. වෙනදාමෙන් උපකාරක පංතිවලට, පාසලට නොගොස් ගුරුවරයෙක් හමුවීමට නොහැකිව සිටින මේ තත්වය හමුවේ හැකි උපරිමයෙන් මා සතු සම්පත්වලින් තාක්ෂණය ප්‍රයෝජනයට ගනිමින් මාර්ගගතව අධ්‍යාපන කටයුතුවල නිරත වෙමි. සාමාන්‍ය ක්‍රමය තරම් සාර්ථක නොවූවද උපරිම ලෙස අවස්ථාවෙන් ඵල නෙලා ගැනීමට මම උත්සුක වෙමි.*

*ආදරණීය අම්මේ තාත්තේ, ඔබ දෙපල මෙරට හෝ විදේශ රටක හෝ සිටින බව මා දනිමි. එසේ ම ඔබ දෙපළ හා මා අතර ඇති වූ මෙම ශක්තිමත් ධාරක සම්බන්ධතාවයට මේ වන විට වසර 06කි. 06 ශ්‍රේණියට ඇතුළත්ව ද්විතීයික*

අධ්‍යාපනය ආරම්භ කළ මුල් අවධියේ පටන් මේ දක්වා ම ඔබ දෙපල නොමඳව කැපවුණි. ඔබ දෙපල දහඩිය මහන්සියෙන් උපයන මුදල මා වෙත ද පරිත්‍යාග කළහ. මාගේ ද්විතියික අධ්‍යාපනයේ එක් අර්ධයක් අවසන් වීමට දැන් ඉතාමත් ආසන්නය. එම නිමාව පසුතැවීමක් නොවී සතුටක්, ආත්ම තෘප්තියත් බවට පත්කර ගැනීමට මට හැකියාව ලැබුණේ ඔබ දෙපලට පිංසිදු වන්නට ය. සැබවින් ම දෙමාපියන්ටත් විශාල බරක් නොවී මා ගත කළ එම කාලය පිළිබඳ ආපසු හැරී බැලීමේ දී මා හට ඇතිවන්නේ වචනයෙන් කියා ගත නොහැකි ආඩම්බරයකි. ආත්ම තෘප්තියකි. මේ සියල්ලෙහිම නිහඬ පෙරගමන්කරු ඔබ දෙපලයි. මා 06 ශ්‍රේණියේ සිට මේ දක්වා ම තිබූ සෑම වාර විභාගයකින් ම මා පංතියේ පළමුවෙනියා වුනෙමි. එයට ප්‍රධානම හේතුව මෙම ශිෂ්‍යාධාර අරමුදල යි. කෙතරම් වෙහෙස දැනුනත් එය පසෙකලා මා පාඩම් කළේ ශිෂ්‍යාධාරය රැක ගැනීමට ය. මා වෙත සපයන ලද මෙම රුකුලට ඔබ සියලු දෙනාට ම පාද නමස්කාරකව ස්තූතිවන්ත වෙමි. කෙතරම් ලියුවත්, කෙතරම් වර්ණනා කළත්, ඔබ දෙපලගේ ඒ අමිල සේවය, උත්තරීතර හැඟීම, සෙනෙහස මං වචන කිහිපයකින් කඩදාසියක් මතට ගොනු කළ නොහැකිය.

ඔබ දෙපළ නොමඳව මා වෙනුවෙන් කළ උපකාරයට උපමා, පිරුළු මා සතුව නැත. මුදල් ම පමණක් නොව වසරක් පාසා අප වෙනුවෙන් උත්සව පවත්වා, ශිෂ්‍යාධාර අලුත් කරමින් අපගේ ලොකු ස්වාමීන් වහන්සේගේ අනුදැනුම අනුව සිදු කරන මෙම ක්‍රියාවලිය මුදල් නොමැතිකම නිසා අධ්‍යාපනය අධ්‍යාපනය මගහැරී ගිය මා වැනි සුවහසක් දූ දරුවන්ට නොමඳ ආලෝකයකි. මුදල් නිසා වැසී තිබුණු පොතක් වන් වූ අධ්‍යාපනය අප වෙත විවර කරදුන් කන්නන්ගරයාණෝ ඔබ පිරිසයි. ජීවිතයේ වැදගත්ම කාලය වන මෙම ඉගෙනුම  ලබන කාලය තුළදී එය හරිහැටි ධාර්මිකව ගත කිරීමට මුදලට ම පමණක් සීමා නොවී දහම් උපදෙස් ද, ජීවිත උපදෙස් ද, දිරිගැන්වීම් ද, ලබා දෙමින් වසර 06ක් පුරාවට ම ඉටුකළ මෙම මෙහෙය වෙනුවෙන් මා හිස නමා ආචාර කරමි. මා හට එම කැපවීම වෙනුවෙන් දියහැකි හොඳම ත්‍යාගය වනුයේ හොඳින් ඉගෙනීම බව මා දනිමි. එම නිසා සියල්ල පසෙකලා මම අධ්‍යාපන කටයුතුවලම නිරත වෙමි.

කොතරම් දුෂ්කර තත්වයක් හමුවේ වුවද ඔබ දෙපල කිසිදා මගේ ගිණුමට මුදල් බැර කිරීම අතපසු කළේ නැත. විශේෂයෙන් ම රට තුළ මෙවැනි වසංගත තත්වයක් ව්‍යාප්තව පවතිද්දීවත් අතපසු නොකළ මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූතිය පමණක් ප්‍රමාණවත් නොවුවද මා හට ලබාදිය හැක්කේ ද එය පමණි.

ආදරණීය අම්මාට හා තාත්තාටත්, අපගේ ලොකු ස්වාමීන් වහන්සේටත් අනෙකුත් සියලුම දෙනාටත් නිදුක් නිරෝගී වාසනා ගුණය පිරි ශ්‍රී සුබ නව වසරකට ඔබගේ දියණිය ආසිරි පතමි. ජීවන මංතලයේ වැදගත් සන්ධිස්ථානයක් මෙන් ම අනාගතය තීරණය වන එම කඩයිමට ඇත්තේ තවත් මාස 02ක් තරම් කෙටි කාලයකි. කෙසේ හෝ O/L කඩයිම සාර්ථකව ජය ගැනීමට මා උපරිමයෙන් කැප වෙමි. එය ඔබ සියලු දෙනාගේම පැතුම බව මා දනිමි.

මීට පෙර ලිපියක් එවීමට නොහැකි වීම ගැන මා සමාව අයැද සිටිමි. නමුදු ඔබ සියලු දෙනාගේ ආශිර්වාදය සමඟම නිතතුරු රැඳී තිබෙන බව මා දනිමි. ඔබ දෙපළ ඇතුළු පවුලේ සැමටත්, ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු අනුගාමික ගිහි පැවිදි පිරිසටත් නව වසරට සුබ පතමින් මා මේ ලිපිය නවතමි.
දළදා සමිඳු පිහිටයි!

දළදා සමිඳු පිහිටයි...!

මීට කැපකරු දියණිය...

නමෝ බුද්ධාය!

දයාබර කැපකරු අම්මේ තාත්තේ,


මාගේ ආදරණීය කැපකරු අම්මේ තාත්තේ. ඔබ දෙදෙනාගේ සුවදුක් කෙසේද? ඔබ දෙදෙනා විසින් පසුගිය මාසවල එවන ලද ශිෂ්‍යාධාර මුදල් රටේ පවතින දරුණු රෝගය නිසා බැංකුවට යාමට නොහැකි විය. පසුව මම එම මුදල් ලබා ගතිමි. පාසල් නිවාඩු බැවින් සුළු මුදලක් පුණ්‍ය කර්මයක් වෙනුවෙන් යෙදුවුවා. ඉතිරි මුදල් පාසල් පටන් ගත් පසු උපකරණ ලබාගැනීම සඳහා පරිස්සමට අරගෙන තිබ්බා. අම්මේ තාත්තේ ඔබ දෙපලට කීමට සතුටු කරුණක් ඇත. මම මෙවර ශිෂ්‍යත්ව විභාගයට ලකුණු 184ක් අරගෙන අප පාසලේ ඉහළින් ම සමත් වුණා. මම ආසයි ලොකු පාසලකට ගොස් ඩොක්ටර් කෙනෙක් වෙන්න. කවදාහරි ඩොක්ටර් කෙනෙක් වෙලා ඔබ දෙදෙනා හොඳින් බලාගන්නවා.

මට ලැබුණු මුදල් සන්තෝසයෙන් ආච්චි අම්මාට හඳුන්කූරු පෙට්ටියක් හා තිර පැකට් දෙකක් අරන් දුන්නා. අක්කාට හා අයියලා දෙදෙනාට පෑන් 2 බැගින් අරන් දුන්නා. අම්මාට හා තාත්තාට සබන් කැටය බැගින් ද කොරෝනා රෝග යෙන් නිරෝධායනය කරන ගෙදරකට තේ කොළ පැකට් එකක් ද අරන් දී මම ලොකු සතුටක් ලැබුවා. මාගේ අම්මාටයි තාත්තාටයි ඔබ දෙදෙනා විසින් දෙන ශිෂ්‍යාධාර මහගු හයියක්. මාගේ ශිෂ්‍යත්ව ලකුණු දැනගත් මොහොතේ අම්මාගේ කටින් කියවුනේ කැපකරු දෙමව්පියන්ට පිං සිද්ධ වෙන්න මාගේ පුතාට උගන්වන්න පුළුවන්... මට හරි ම සතුටුයි.

මගේ ලොකු අයියා මෙවර උසස්පෙළ විභාගයට ලිව්වා. පොඩි අයියා සාමාන්‍ය පෙළ විභාගය ලියනවා. අක්කා 08 ශ්‍රේණියේ ඉගෙන ගන්නවා. අපේ තාත්තා අපට උගන්වන්න මහත් වෙහෙසෙක් ගන්නවා.

කිසි දිනෙක නෙතට නොදැක මා ගැන අනුකම්පාවෙන් ඔබ දෙදෙනාගේ මහන්සියෙන් උපයන මුදලින් කොටසක් වෙන්කළ ඔබට උතුම් තුනුරුවනේ ආශිර්වාදයෙන් යහපත් ජීවිතයක් ගත කිරීමට ශක්තිය ලැබේවා'යි මා ඇතුළු අප පවුලේ සියල්ලෝම ප්‍රාර්ථනා කරනෙමු.

මීට කැපකරු පුතණුවන්...



# මඛාදේව ජාතකය

## මඛාදේව බෝසත්රජුගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

අපගේ බුදුරජාණන් වහන්සේ ගණන් නොකළ හැකි තරම් කල්ප ගණන් පෙරුම් පිරූ බව අපි අහලා තියෙනවා. ඒ පාරමී පිරීම ලෝකයේ සාමාන්‍ය මිනිසුන්ට කළ හැකි දෙයක් නොවෙයි. අපේ බෝසතාණන් වහන්සේ පාරමී පුරා ඇති අයුරු ඉගෙන ගැනීමෙනුයි ඒ බව අපට වැටහෙන්නේ. උන්වහන්සේ අනන්ත අතීත ආත්මවලදීත් සංසාර විමුක්තිය සොයාගෙන සියලු දේ අත්හැර ගිය කෙනෙක්. එයට කියන්නේ නෛෂ්ක්‍රම්‍යය කියලයි. පාලි භාෂාවෙන් 'නෙක්ඛම්ම' කියලා කියනවා. සසර දුකින් නිදහස් වීමේ ආශාවෙන් සියලු කාම වස්තු අත්හැර දැමීමයි. මහබෝසතාණන් වහන්සේ ගේ අත්හැර දැමීම හරි පුදුම සහගතයි.

ඉතින් දවසක් සැවැත් නුවර දම්සභා මණ්ඩපේට භික්ෂූන් වහන්සේලා රැස් වුනා. භාග්‍යවතුන් වහන්සේ විමුක්තිය සොයා අභිනික්මන් කළ ආකාරය ගැන කතාබස් කරමින් සිටියා.

"හැබෑට ම ඇවැත්නි.... සාමාන්‍ය මනුෂ්‍යයෙකුට එහෙම දේ කරනවා කියා සිතින් සිතාගන්ටවත් බැහැ. රාහුල සිඟිති කුමාරයා උපන් දවසේ ම ගිහි බන්ධනය සිඳ බිඳ දැම්මා නොවැ. රම්‍ය, සුරම්‍ය, සුභ කියලා තුන් ඍතුවට ම හැදූ මාළිගා දිහා හැරිලාවත් බැලුවේ නැහැ නොවැ. කනකලතාවක් වගේ රූසිරින් බැබලී ගිය රාහුල මාතාවන් දෙස නොබලා විමුක්තිය දෙස බලාන ගියා නොවැ..... එහෙම එඩිතර තීරණයක් ගන්න සාමාන්‍ය මනුෂ්‍යයෙකුට කිසිම හැකියාවක් නෑ....."

ඔය අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩමවා වදාළා. පනවන ලද බුද්ධාසනයෙහි වැඩ සිටියා.

"මහණෙනි, මං එන්නට පළමු කතාබස් කරමින් සිටියේ කුමන කරුණක් ගැන ද?"

"ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, අපි දෙතිස් කතා ආදී ධර්ම මාර්ගයට හානිකර වූ ලාමක කතාවන් කළේ නෑ. අපි මේ කතාබස් කරමින් සිටියේ භාග්‍යවතුන් වහන්සේ එදා සම්බුදු බව පිණිස, උතුම් විමුක්තිය පිණිස ගිහි ජීවිතය අත්හැර අබිනික්මන් කළ ආශ්චර්ය අද්භූත ආකාරය ගැනයි."

"මහණෙනි, විමුක්තිය සොයාගෙන ගිහි ජීවිතය අත්හැර ගිහි ගෙයින් නික්ම ගියේ මේ ජීවිතේ විතරක් නොවෙයි. කෙළවරක් නැති අතීත සසරේ මං අනන්තවත් එහෙම ගිහි ජීවිතේ අත්හැර ගිහින් තියෙනවා."

"අනේ ස්වාමීනී.... භාග්‍යවතුන් වහන්ස, ඒ අතීත ආත්මයේ බෝසත් අවධියේ භාග්‍යවතුන් වහන්සේ ගිහි ජීවිතය අත්හැර ගියේ කොහොමද? අපි ඒ ගැන කථාවක් අහන්නට කැමතියි."

එතකොට භාග්‍යවතුන් වහන්සේ කාලයේ වැලි තලාවෙන් වැසී ගිය බෝසතුන් ගේ ජීවිත කථා පෙළින් තවත් එක් අවස්ථාවක් මෙසේ පෙන්වා වදාළා.

"මහණෙනි, ගොඩාක් ඉස්සර ඈත අතීතේ දඹදිව විදේහ කියලා රටක් තිබුනා. ඒ රටේ මිථිලා කියලා අගනුවරක් තිබුනා. ඒ නගරේ 'මඛාදේව' කියල රජෙක් වාසය කළා. ඔහු ඉතා ධාර්මිකයි. දැහැමි රජෙක්. ඒ කාලේ මිනිස්සුන්ට ගොඩාක් වයස තිබුනා.

ඉතින් ඒ මඛාදේව රජුත් කුමාරයෙක් හැටියට අසූහාරදහසක් අවුරුදු සෙල්ලමෙන් ගත කළා. යුවරාජ තනතුරෙත් අසූහාරදහසක් අවුරුදු ගත කළා. මහාරජෙක්

හැටියටත් අසූහාරදහසක් අවුරුදු ගත කළා. දවසක් මේ මඛාදේව රජ්ජුරුවෝ තමන් ගේ හිස පීරා සරසන සේවකයාට කතා කළා.

"මිත්‍රය..... ඔබ මගේ හිස පීරද්දී මගේ හිසේ ඉදී ගිය කෙස් ගසක් දැක්කොත් වහාම මට දැනුම් දෙන්න ඕනා."

එදා ඉඳලා මේ සේවකයා ඉතාම ඕනෑකමින් හිස පීරනවා. බොහෝ කාලයක් ගත වුනාම රජ්ජුරුවන් ගේ අඳුන් වැනි කාලවර්ණ කේශ කලාපයේ එක කෙස් ගසක් ඉදී තිබෙන බව ඔහුට දකින්නට ලැබුනා.

"දේවයන් වහන්ස..... ඔබවහන්සේ ගේ සිරසෙහි කාලවර්ණ කෙස් ගස් අතරේ එක කෙස් ගසක් ඉදී තිබෙන බව පෙනේ!"

"බොහොම හොඳයි මිත්‍රය..... එහෙම නම් ඒ ඉදුනු කෙස් ගස උදුරලා මගේ අතින් තියන්න."

එතකොට කෙස් පීරන සේවකයා රන් අඬුව ගෙනැවිත් බොහෝම පරිස්සමෙන් ඒ ඉදුනු කෙස් ගස ගැලෙව්වා. මඛාදේව රජ්ජුරුවන්නේ අතේ තිබ්බා. ඒ වෙද්දී මඛාදේව රජුට තව අසූහාරදහසක් අවුරුදු ජීවත් වෙන්න කාලය ඉතිරි වෙලත් තිබ්බා. එසේ තිබියදීත් ජීවිතය ගැන මෙහෙම සිතුවා.

"ඕ... හෝ.... මගේ ජීවිතේ ගෙවිලා ගියා නොවැ. මාරයා පැමිණෙන බව ඕං මට දැනුම් දුන්නා. තමන් ඉන්න ගෙදර වහළට ගිනි ඇවිලුනා වගෙයි මේ ලකුණ" කියල ඔහු තමාට ම අමතන්න පටන් ගත්තා.

"එම්බල මඛාදේව.... නුඹ මහා මෝඩයෙක්..... ඇයි නුඹ තවත් ප්‍රමාද වෙන්නේ....? කෙස් ගසක් ඉදුනා.... ඕන්න....

නුඹට ජීවිතේ අවසන් වෙන බව දැනුම් දුන්නා. නුඹට තාමත් මේ කෙලෙස් අත්හරින්ට බැරිද?"

මහණෙනි.... ඉතින් මඛාදේව රජ්ජුරුවෝ අර කෙස් ගහ අතේ තියාගෙන නැවත නැවතත් ජරා මරණ ගැන මෙනෙහි කළා. එහෙම දිගින් දිගටම මෙනෙහි කරද්දී ශරීරය ඇතුලෙන් දාහයක් උපන්නා. ශරීරයෙන් දහඩිය ගලන්න පටන් ගත්තා. සළුපිළි දහඩියෙන් හොඳටම තෙත් වෙලා ගියා. එතකොට මෙහෙම සිතුවා.

"ඔව්! මං අද ම මේ හැම දෙයක් ම අත්හරිනවා.... ඔව්.... මං අදම පැවිදි වෙනවා..." කියලා ඒ හිස පීරපු සේවකයාට කහවණු ලක්ෂයක ආදායම ඇති ගම්වරයක් දුන්නා. තමන්ගේ වැඩිමහල් පුත්කුමරාව කැඳෙව්වා.

"මා ප්‍රිය පුත්‍රය.... මගේ හිසේ කෙස් ගසක් ඉදිලා ගියා. මං දැන් මහල්ලෙක්. ජරා මරණය ඇති දිසාවට මුහුණ හරවාගෙන යන කෙනෙක්. මිනිස් ලෝකේ ඇති සම්පත් මං දැන් වින්දා නොවැ. මං දෙව්ලොව යන්නයි ආසා. ඒ නිසා මං හැම කාම සම්පත්තියක් ම අත්හරින්න තීරණය කළා. ඔබට අදම මේ රාජ්‍යය පවරනවා. මට මේ මඛාදේව අඹ වනයේ වාසය කරමින් බණභාවනා කරගෙන වසන්නට පුළුවනි."

මේ කාරණය ඇමතිවරුන්ට සැලවුනා. ඔවුනුත් වහා මාළිගාවට රැස්වුනා. "දේවයන් වහන්ස,.... ඔබවහන්සේ රජකම අත්හැරලා මේ සියලු සැප සම්පත් අත්හැරලා මේ තරම් ඉක්මනින් පැවිදි වෙන්න තීරණය කලේ මන්ද?"

එතකොට මහණෙනි... ඒ මඛාදේව රජ්ජුරුවෝ අර ඉදී ගිය කෙස් ගස තම අත මත තබාගෙන ඒ ඇමතිවරුන්ට මේ ගාථාව පැවසුවා.

'මගේ හිස කෙස් මතුයෙහි
ජීවිතේ ආයුෂ පැහැර ගන්නා
මේ ඉදුනු කෙස් පහළ වී ඇත
ජරා මරණයෙ ලකුණු අරගෙන
පැමිණියාහුය දේවදූතයෝ
දැන් මට පැවිදි වෙන්නට කාලය යි!'

මහණෙනි... ඉතින් ඒ කාලෙත් ඒ මඛාදේව රජු එබඳු සුළු කරුණකිනුත් ගිහි ජීවිතේ ගැන කළ කිරුනා. පැවිදි වෙන්නට කැමති වුනා. ඒ වෙනුවෙන් හැම දෙයක් ම අත්හැරියා. එදාම අත්හැරියා. ඍෂි පැවිද්දෙන් පැවිදි වුනා. මාළිගයෙන් බැහැලා මඛාදේව අඹ වනයට පිටත් වුනා. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහාර භාවනාව කළා. ධ්‍යාන උපදවා ගත්තා. අසූහාරදහසක් අවුරුදු පැවිදි ජීවිතය ගත කළා. මරණින් පසු බ්‍රහ්ම ලෝකයේ උපන්නා. ගොඩාක් කල් ඒ බ්‍රහ්ම ලෝකයේ වාසය කළා. ආයෙමත් ඒ බ්‍රහ්ම ලෝකෙන් චුත වුනා. ඒ විදේහ රටේ මිථිලා නුවර ම නිමිරාජයා නමින් රජ වුනා. ඒ රාජවංශයේ දීර්ඝ ධාර්මික පාලනයට උත්සාහ කළා. ඒ රාජකීය ජීවිතය අත්හැරියා. ආයෙමත් පැවිදි වුනා. බ්‍රහ්මවිහාර භාවනාව කළා. ඒ අඹවනයේ ම වාසය කළා. නැවතත් මරණින් පසු බ්‍රහ්මලෝකයේ ම උපන්නා.

මහණෙනි... තථාගතයන් විමුක්තිය සොයාගෙන අභිනික්මන් කළේ මේ ආත්මයේ විතරක් නොවේ. කෙළවරක් නැතිව මේ සසරේ ඔය විදිහට ගිහි ගෙයින් නික්මී විමුක්තිය සොයාගෙන ගිහින් තියෙනවා.

නමුත් මහණෙනි.... ඒ හැම අවස්ථාවෙම ආපහු කරකැවී සසරට එන්නට සිදුවුනා. දැන් එහෙම නොවෙයි. මේ අවස්ථාවේ කෙනෙක් විමුක්තිය කරා ගියොත් කිසිදාක භව දුකකට වැටෙන්නේ නෑ"යි වදාළ භාග්‍යවතුන් වහන්සේ

චතුරාර්ය සත්‍යය ධර්මය මැනවින් දේශනා කොට වදාළා. ඒ භික්ෂූන් වහන්සේලා ඒ දේශනාවට හොඳින් සවන් දුන්නා. බොහෝ දෙනෙකුට තම තමන්ගේ නුවණට අනුව ඒ ධර්මය අවබෝධ වුනා. සමහරු සෝවාන් වුනා. සමහරු සකදාගාමී වුනා. සමහරු අනාගාමී වුනා. සමහරු රහත් වුනා.

"මහණෙනි... ඒ කාලේ මගේ හිස පීරන සේවකයා වෙලා උන්නේ මේ අපගේ ආනන්දයන්. මං රාජ්‍යය පැවරූ පුත්‍රයා වෙලා හිටියේ රාහුලයන්. මඛාදේව රජ්ජුරුවෝ වෙලා හිටියේ මම යි" කියලා භාග්‍යවතුන් වහන්සේ මේ ජාතක කථා දේශනාව අවසන් කොට වදාළා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

සංසාරය ගැන නොදත් බොහෝ දෙනෙක් අපගේ භාග්‍යවතුන් වහන්සේ ගිහි ජීවිතය අත්හැරදා ගිය ආකාරය ගැන නොසතුටු වෙනවා. රාහුල කුමාරයා තනි වුනාලු. අප්පච්චියෙක් නැති වුනාලු. රාහුලමාතාවටත් මහා අසාධාරණයක් වුනාලු. කාම මඩ ගොහොරුවේ නාසයටත් ඉහළින් ගිලී සිටින සාමාන්‍ය ලෝකයාට මේ වගේ දෙයක් ගැන සිහිනෙකින්වත් සිතාගන්නට බැහැ. ඔවුන් කාමය නිසා ම හටගන්නා ආරවුල් වලදී දරුවන් පොළොවේ ගසා මරනවා. තම බිරිඳ මරා දමනවා. පුරුෂයා මරා දමනවා. බලන්න. අපගේ භාග්‍යවතුන් වහන්සේ ගේ බෝසත් ජීවිතය පවා කොතරම් අසිරිමත් ද! මොනතරම් සැහැල්ලු ද. අහිංසක ද. බලකාමයෙන් මත් වූ බල අරගලයෙන් වියරු වැටී ගිය ලෝකය ඉදිරියේ මේ ලස්සන කතා අසන්නට ලැබීමත් වාසනාවකි!



# ගෙවී ගිය කාලේ
# යළිත් නොඒ ම ය...

දයාබර දුවේ පුතේ,

මුළුමහත් ලෝකය ම එක ම එක අර්බුදයක් ඉදිරියේ කිසිවෙකු නොසිතූවිරූ ආකාරයට නැවතිලා. වසර එක හමාරක් පුරා ලෝකයේ අස්සක් මුල්ලක් නෑර විහිද පැතිර යන කොවිඩ් වසංගත රෝග තත්ත්වය නිසා එදිනෙදා කටයුතුවලට කිසිදු බලපෑමක් නොවූ අයෙකු සොයා ගැනීම කළුනික සොයනවා වගේ දුර්ලභ දෙයක්. සියල්ලන්, සියලු දෙය එක ම එක බාධකයක් ඉදිරියේ බියටත්, පුදුමයටත් පත් වෙලා සිටින කාල වකවානුවක් තමයි මේ ගෙවී යන්නේ. අපට හුරුපුරුදු වුණ, අප නිරායාසයෙන් ම අනුගත වී සිටිය එදිනෙදා ජීවිතය අපට මඟහැරිලා.

ගුරුවරුන්, මිතුරු මිතුරියන් සමඟ ගෙවී ගිය ඔබගේ පාසල් ජීවිතය දැන් මතකයක් බවට පත් වෙමින් ඔබෙන් ඈත් වෙනවා. දවස ගානේ රැකීරක්ෂා කටයුතු පිණිස ආපු ගියපු ඔබගේ දෙමව්පිය වැඩිහිටියන්ගේ ජීවිතත් ඒ ඒකාකාරී කාර්යබහුලත්වයෙන් මිදිලා. හැබැයි, කාර්යබහුල ස්වභාවයන්ගේ යම් අඩු වීමක් තිබුණාට දිනෙන් දින ඉහළ යන රෝගීන් සංඛ්‍යාවත්, මරණ සංඛ්‍යාවත්, රෝගී වීමෙන් පසුව ඇති වන සංකූලතා පිළිබඳ අවදානමත් විසින් දැනුම් තේරුම් ඇති පිරිස තුළ ඇති කළ බිය සෑම මොහොතක් පාසාම ඉහළ යමින් පවතිනවා. කෙළවරක් කොතැනදැයි සිතන්නටවත් නොහැකි ව්‍යාධි බිය ඉදිරියේ නොයෙක් ආකාරයන්ගෙන් අපේ ජීවිතවල හුරුපුරුදු ගලා යෑමේ යම් බිඳී යාමක් සිදුව තිබෙන බව බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා.

ඒ කොහොම වුණත්... කවරක් නැවතී තිබුණත්... දයාබර දුවේ පුතේ, හිරු පෙර සේ ම නැගී බැස යනවා. සඳුත් පෙර සේ ම නැගී බැස යනවා. කාලය නොනැවතී ගලා

යනවා. ඔව්... නැවත කිසිදිනෙක අප කරා පැමිණෙන්නේ නැති ජීවිත කාලයක් අපට අහිමි වෙනවා. අප වයසට යනවා. ජරාවෙන් අපේ ජීවිත නොනැවතී ම යට වෙනවා. කෙස් පැසෙන, දත් වැටෙන, හම රැලි වැටෙන, අතපය වාරු නැති වෙන, ඇස් හරියට නොපෙනෙන, කන් හරියට නොඇසෙන පොදු ඉරණම කරා අප නොනැවතී ගමන් කරමින් සිටිනවා. ඒ ගමන අතරමඟ එළඹුනු එක් ව්‍යසනයක් පමණයි කොවිඩ් කියන්නේ...

මෙවැනි විපතක් ලෝකයේ හට ගත්තේ පළමු වතාවට නෙමෙයි. මින් පෙර, වාර්තාගත ඉතිහාසයේ වරින්වර එළඹුනු ස්පාඤ්ඤ උණ, කොළරාව, මහාමාරිය, කුරුලු උණ, සූකර උණ ආදී නොයෙක් නම්වලින් හැඳින්වූ වසංගතයන්ගේ පැතිර යාම් හමුවේ සියදහස් ගණනින් මිනිස් ජීවිත අහිමි වූ බවත්, අති විශාල ජනකායක් පීඩාවට පත් වූ බවත් දැනගන්නට තිබෙනවා. ඇතැම් අන්තඃකල්ප විනාශයන්හි දී අති බිහිසුණු රෝගයන්ගේ පැතිර යාම නිසාවෙන් ම මනුෂ්‍ය වර්ගයා විනාශයට පත් වන බව ධර්මයේ සඳහන් වනවා. එවැනි අවස්ථාවන් රෝග අන්තඃකල්පය කියා හඳුන්වනවා. එනිසා, මේ ස්වභාවය පෙර කිසිදිනෙක නොවූවිරූ අතිශය අද්භූත කාරණාවක් නම් නොවන බව අප පැහැදිලිව තේරුම් ගත යුතුයි. දුවේ පුතේ, උපන්නා වූ සත්වයන් කරා රෝගපීඩා එළඹෙනවා යනු කිසිසේත් ම පුදුමයක් නොවෙයි. අප සරණ ගිය ශාස්තෘන් වහන්සේ දේශනා කොට වදාරා තිබෙන්නේ මේ කය රෝග පීඩා පැටව් ගසන කැදැල්ලක් බඳු වූවක් කියල යි.

මේ කරුණු කාරණා සලකා බලනකොට ඇත්තට ම අප කරදර විය යුත්තේ පැතිරී යන ව්‍යසන ගැන නෙවෙයි; නොනැවතී අපට අහිමි වන මේ ජීවිත කාලය ගැනයි... දුවේ

පුතේ, සම්මා සම්බුදුරජාණන් වහන්සේනමක් ලෝකයේ පහළ වනවා යන්න සිදු වන්නේ ඉතාමත් ම කලාතුරකින්. අපගේ ශාස්තෘන් වහන්සේ පෙරුම් පුරා පැමිණි සසර ගමනේ දීපංකර සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සිරිපා මුල මතු සම්මා සම්බුදු වන්නට නියත විවරණ ලැබීමෙන් පසු අසංඛෙය්‍ය කල්පයක් ගෙවී යන තුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේනමක් මුණගැසුනේ නෑ. සිත නිවන - සිතේ නිවනට මඟ කියන සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පහළ වීම ඒ සා දුර්ලභයි. එසේ වීත්, මේ ගෙවී යන කල්පය තුළ මේ වනවිට සම්මා සම්බුදුරජාණන් වහන්සේලා හතරනමක් පහළ වී අවසන්. මේ කල්පය ගෙවී යන්නට පෙරාතුව මෛත්‍රී සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද ලොව පහළ වන බව සම්බුදු මුව මඬලින් දේශනා කොට තිබෙනවා. එසේ ලොව පරම දුර්ලභ පුරුෂ මහෝත්තමයාණන් වහන්සේලා පස්නමකගේ පහළ වීම සිදුවන නිසාවෙනුයි මේ කල්පය 'මහා භද්‍ර කල්පය' කියා හඳුන්වනු ලබන්නේ...

දයාබර දුවේ පුතේ, මේ මහා භද්‍ර කල්පයේත් ගෙවී ගිය අන්තඃකල්පයන් අතර සම්බුදුරජාණන් වහන්සේනමක් ගැන අසන්නටවත් නොලැබුණු අන්තඃකල්පයන් තිබුණා. මිනිසුන්ගේ ආයුෂ වසර දහයේ සිට අසංඛෙය්‍ය දක්වා වැඩි වී නැවත අසංඛ්‍යයේ සිට වසර දහයක් දක්වා අඩු වීම අතර ගෙවී යන කාලය වසර ගණනින් මෙපමණකැයි දක්වන්නට නොහැකියි. එවැනි කාල සීමාවක් තමයි අන්තඃකල්පය කියා හඳුන්වන්නේ. සම්මා සම්බුදුරජාණන් වහන්සේලා හතරනමක් පහළ වූ මේ මහා භද්‍ර කල්පයේත් බුද්ධ යන වචනය පවා අසන්නට නොලැබුණු වසර කෝටි ප්‍රකෝටි ගණනක් තිබුණා යන්න සිතින් සිතා ගන්නටත් බැරි තරම්. එහෙත් දුවේ පුතේ, එය තමයි සත්‍යය. අපට අනන්ත සසරේ සම්මා

සම්බුදුරජාණන් වහන්සේලා ව මගහැරුණු කාලයම යි වැඩි. පරම දුර්ලභ බුද්ධ රාජ්‍යයන් අතිශයින් කලාතුරකින් පමණක් මුණගැසෙමින් පැමිණි සසරේ දී අපට මේ මිනිස් ජීවිතය ලැබුණේ ඒ පරමෝත්තම වාසනාව උරුමයක් කර දෙමින්. ඔව්... මේ උපත තුළ අපට සම්මා සම්බුදුරජාණන් වහන්සේ ව සරණ යන්නට ලැබුණා. ඒ උත්තම ධර්ම රත්නයත්, ආර්ය මහා ශ්‍රාවක සංඝරත්නයත් සරණ යන්නට ලැබුණා. මේ මහගු වාසනාවේ අගය දක්වන්නට අපට වචන නැහැ. එය අවචනීයයි. අනිර්වචනීයයි. අප්‍රමාණයි. සම්මා සම්බුද්ධ රාජ්‍යයක ශ්‍රාවකත්වය උරුමය වූ මේ මිනිස් ජීවිතය රෝග ව්‍යසනයක් ඉදිරියේ 'ඔහේ ගෙවී යාම' ගැනයි අප සැබැවින් ම කරදර විය යුත්තේ.

මේ මුහුණ දෙන විපත් ඉදිරියේ කය යනු කිසිවකින්, කිසි ලෙසකින් රැක ගත නොහැක්කක් බව අප තේරුම් ගත යුතු යි. කවා පොවා නහවා සතපා සුවඳ ගල්වා නිතර සොයා බලමින් පිළියම් කළා වුවත්, රැක බලා ගත්තා වුවත් මේ කය අපට වුවමනා විදිහට පැවැත්විය නොහැකියි. ඒකාන්තයෙන් ම දිරීම, වැනසීම, නැසීම ඉරණම කොටගෙනයි කය තිබෙන්නේ. කොවිඩ් වගේ රෝගයකට වුණත්, මැසි මදුරුවනට වුණත්, වාහනයකට වුණත්, කන කෑම ටිකට වුණත් මොහොතකින් මේ කයේ පැවැත්ම බිඳ හෙළන්නට පුළුවනි. හැබැයි... කය එසේ වූවාට සිත යනු අපට රැක ගත හැක්කක්. සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ලෝකයේ පහළ වී වදරන්නේ කයත්, වචනයත් සංවර කරගෙන - සිත රැකගෙන මේ දුක්තැවුල් පිරුණු සසරින් එතෙර වන ශ්‍රේෂ්ඨ මාර්ගය යි. ඒ ශ්‍රේෂ්ඨ මාර්ගය ප්‍රතිපදාවක් ලෙසින් පුරුදු පුහුණු කළ යුත්තක්. මේ ගෙවී යන කාලය ඒ ප්‍රතිපදාව ද අපට මගහැරෙන කාලයක් වුවහොත් ඒ තමයි ව්‍යසනය, ඒ තමයි අර්බුදය, ඒ තමයි සැබෑම විපත.

දුවේ පුතේ, යන එන ගමනෙ බිමනේ පය පැකිළිලා වැටිලා වුණත් අප මැරෙන්න පුළුවනි. ඉතින්, රැයේ නින්දකට වැටී සිට උදෑසන අවදි වී යහනින් බැස තබන පළමු පය පැකිළී වැටීමෙන් වුණත් ඒ මරණය සිදු වෙන්න පුළුවන් නේ ද? ඒ නිසා, උදෑසන නැගිටින විටත් අප සරණ ගිය - මේ දුක්ඛිත සසරට එක ම රැකවරණය වූ ඒ තෙරුවන සිහි කිරීම ම යි අපට ආරක්ෂාව. ගමන් බිමන් යන විටත්, වැඩපළ කරනා විටත්, නින්දට යන විටත්, ගත කරන සෑම අවස්ථාවකදීමත් ඒ තෙරුවන සිහි කිරීම ම යි අපට ආරක්ෂාව. සිහිනෙන් සිතුවත් සෙත සලසාලන උත්තම ශාස්තෘන් වහන්සේ ව ආදරයෙන් සරණ යන්නට අපට ලැබුණු මේ මහානීය උරුමය අපතේ හරින්නට එපා.

උදෑසන උණු පැන්, සිසිල් පැන් ඒ ශාස්තෘන් වහන්සේට පූජා කරන්න. ආහාරයට ගන්නා පලතුරක, රසකැවිල්ලක වුණත් පළමු කොටස සම්මා සම්බුදුරජාණන් වහන්සේට වෙන් කොට පූජා කරන්න. සම්බුද්ධ වන්දනාව පිණිස මල් වවන්න. සාත්තු කරන්න. එකම එක බණ පදයක්වත් නැසී එකම එක දවසකටවත් ගත වෙන්නට ඉඩ හරින්න එපා. එය ඔබට මහා අලාභයක්.

දිනපතා බුද්ධ වන්දනාව සිදු කරන්න. පිරිත් සජ්ඣායනා කරන්න. ලොව පහළ වීම පරම දුර්ලභ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුව මඬලින් සුදේශිත බුද්ධ වචනයක් ගෞරව සිතින් අපේ මුවින් කියන්නට ලැබීම පවා දුර්ලභ භාග්‍යයක්. දුවේ පුතේ, ඒ නිසා අත්නොහැර මේ ප්‍රතිපදාව රැක ගන්න. ශිල්පයන් ඔබ උගත යුතුයි. එය මේ ජීවිතයට වැදගත්. එසේ ම සම්බුදු සසුනේ දහම් ප්‍රතිපදාව ඔබ පුරුදු කළ යුතුයි. එය ඔබට මුළුමහත් සසරට ම වැදගත්.

සසර ගමනේ නිසැක විපත්වලට ගොදුරු වෙවී, දුක් පීඩා ළතැවුල් නිමක් නොමැතිව ආයෙ ආයෙමත් සැරිසරා යන අවාසනාවන්ත ඉරණමෙන් ගැලවී යන්නට අන් මගක් නැහැ. ඒකාන්ත දුක් ඇති මේ සසර විපත්තියෙන් මිදී ගන්නට ඇති එකම මග ඔබට මගනොහැරේවා! ඔබට සත්පුරුෂ ධර්මය ඇසේවා! ඔබට සත්පුරුෂ ඇසුර ලැබේවා! සියලු විපත් ඉක්මවා නිවී සැනසෙන්නට ඔබට තෙරුවනේ ආශීර්වාදය සැලසේවා!

"බුදු රුවනට වඩා උතුම් - කෙනෙක් මට නැතේ
බුදු බණටත් වඩා උතුම් - දෙයක් මට නැතේ
බුදු පිරිසට වඩා උතුම් - පිරිස් මට නැතේ
තුනුරුවනට වඩා උතුම් - කිසිත් මට නැතේ

උදයේ නැගිටින විටත් - නින්දට මා යන විටත්
ගමන් බිමන් යන විටත් - පොත පත බලනා විටත්
මගේ බුදු සමිඳුන් ගැනත් - ඒ සිරි සදහම් ගැනත්
බුදු පිරිසේ ගුණ ගැනත් - සිහි වේ මේ තෙරුවනත්


සිල් ගුණ දම් වැඩි නිසා - සමාධිමත් සිත නිසා
හිරු සඳු විලසින් බබළන - ඤාණයකුත් ලද නිසා
මගෙ බුදු සමිඳුන් තමා - තුන් ලොවටම හිතවතා
ඒ ගැන මම සිත සිතා - නමදිමි සිරසත් නමා"

(අති පූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ)

තෙරුවන් සරණයි!

# නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව



ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන
ඒ.ජී. ශානිකා අඹගස්පිටිය දියණිය විසින් එවූ නිර්මාණයක්...




කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන තිලිණි කෞෂල්‍යා
දියණිය විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චතුත්තරා කාවින්ද්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගිහාන් සත්නිඳු පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන වගීෂා ශකුණි දියණිය විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.බිම්සර මදුශාන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන තක්ෂිලා සඳුනි
දියණිය විසින් එවූ නිර්මාණයක්...





09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.වී. චමෝද් දිල්ශාන්
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.ඒ. පසිඳු මල්ෂාන්
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ප්‍රශාන් ලක්ෂාන්
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන තිලිණි කෞෂල්‍යා
දියණිය විසින් එවූ නිර්මාණයක්...

"අති දක්ෂ ගල් වඩුවෙකු ඉතා සියුම් ලෙස රළු ගල් කුළක් කැණ. කරුණා ගුණ සපිරි බුදු රුවක් මවන්නා සේ, නේක මිසදිටු පවින් වැසුණු මා, ධර්මද්වීපයක් කළා වූ ද, සභිත කලාවෙන් පෝෂිත කළා වූ ද, මවෙන අනුබුදු සේම වූ ද, ඒ ධර්ම රාජයාණන්ගේ පුත්‍රයෙකු වූ ද, සිංහලයාගේ පරම ගුරුදෙවිඳුන් වූ ද ඒ මිහිඳු මහරහතන් වහන්සේට මේ ලක් වැසියන්ගේ නමස්කාරය වේවා"

දසරාජ ධර්ම තිලෝ තිලක
පරසිදු හෙළ ධර්මදීප
මතු කළා හෙළ තුළින් සේ ම
මැව්වා වූ හිමි අවුකන බුද්ධරාජ...

යකුන් සේ ම රූප ගුණයෙන්
පුදා රැක්ෂ තලා නේක මිසදිටුවෙන්
පෙලුණු සිතට සෙත සදමින්
මිස්සක පව් මත සුරඳුනි සිංහරාජ....

සිහිගිරි බුත්සරණ අමා දිය ගඟුලින් දොවා සිත්
ජයසිරි මා බෝ සෙවණේ අනුරපුරේ නැගුණු කොතින්
පේවුණු සිත් සදා නිතින් අනුබුදු වූ ලකට මෙතින්
හිමි සඳ මා ශාක්‍ය පුත්‍ර මිහිඳු රාජ....

ලක් උවැසි සදුකල්ම නමදි පින් පුරා බැතින්....

කැලණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන හසිත මුණසිංහ
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

**පවතින වසංගතය අභිමුව දූතයෙකු අත සංදේශයක් එවීම අවදානමක් වූ සඳ, ගත යුතු අවසරය ද බොහෝ විය. එබැවින් සමා අවසර, පද ගලපා පවනට මුසු කරමි. ඇසූ කලක තුටු වනු මැනවි.**

තුඟු සමනොළ ගිරි පොබයන සඳ පාන
රැඳි මුනි සිරිපතුල සුරකින සුර රජිඳ
නුඹ පින් බලෙන් මිණි මතුවෙන රුවන් බිම
කර පුද වඳිමු සුමනිඳු දෙව් පුතුනි අප

අරි අටගිය මග පිපුණු කුසුම බඳු
සුදු ඇත් රජිඳ මත සුදිලෙන පහන බඳු
ඉර සේවයට සිරිපා වැඳ සරණ පැතූ
දෙව් පුත් සුමන රජිඳාණන් නුඹයි ගරූ

කර හද මැදුර ගඳකුටියක් හිමිට උතුම්
කළ ඇරයුමට වැඩියා හිමි ගිරට උතුම්
තබමින් සිරිපතුල බල පවතිනා තෙදින්
විමසුවා හිමි උත්තම මේ විලසින්

බෝ දුෂ්කරය කටුකය මෙහි පැමිණීම
සැදැහැති දනෝ කෙලෙසක වෙද මෙහි වැඳුම
හිමියනි නොවනු මැන ඒ ගැන අවිවාද
සැදැහැති දනෝ වන්දමි පුළුනොදක් මෙන

රකිමින් තුන් හෙළේ බැබළෙන බුදු සසුන
දහසක් හෙලේ මව්වරු පැතූ දරු සිහින
කරමින් සඵල දෙවමින් සෙත අපමාණ
සුමන සමන් දෙව් පැතුවේ නිවනයි අපමාණ

උඳුවප් මහේ පුරවර මග එළිය කර
සිරිපා වඳින්නට දෙව් පුතු වඩින සඳ
පේවී ඉදන් නුඹ යන මඟ මල් ඉසින කල
සබරෙම පින් පුරා ඇති වග දැනෙයි මට

කැලණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන හසිත උදේෂ් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

## විභාගය...

දෙනෙත ඇත වෙහෙස වී පොත්
අතර සිර වෙලා
නිදිබර වූ දෙනෙත ළඟ
අකුරු ඇත බොඳ වෙලා
දෙනෙත පොත්පත්වලින්
ඉවත ගෙන බැලිමි මම
කළුවර ඇති නිසල පරිසරය දෙස
නොදිරිමි කිසිවෙක්......
සිතට සහනය ගෙනෙන
ගලා ආ පවන් රොද
සතුටු වන මසිත
යළි සිත අවධි කරයි
වෙහෙස දෙන කඩයිම....

වෙහෙස වූ සිරුර ඇත
පුටුවකට බර වෙලා
ගතෙහි වූ සවිය ඇත
ගොස් ඈත පියඹලා
බුද්ධිය ද වෙහෙස වෙයි
තව දැනුම සොයන්නට
නමුදු අප නොදැනීම
විභාගය කිට්ටු වෙයි....

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුමේධා ලක්මාලි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

මගේ අත්තටු සවිය නංවා
ගුවනෙ මායිම් මා හට පෙන්වන
ඇදුරු වූයෙම් එද මට නුඹ
නේක බාධක හා නොසෙල්වෙන....

වැරෙන් වීරියෙන් ඔබ තැනූ තටු
සවිය ඇත අද මා හට උරුමව
ඉතින් ගගණක දිනා නැසැකව
මුණ ගැහෙන්නම් නැවත දිනයක....

ආයුබෝවන් එතෙක් නුඹ හට.....

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෙව්වන්දි කෞෂල්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

# අභිනිෂ්ක්‍රමණය නොවේ ද මේ සමිඳුනි....

සඳ වතුරක් සේ නිසල දියෙන් ගලනා
නේරංජනා නදී තෙම දැක හද තෙමනා
සීතල කවුලු පියන් අතරින් සඳ පෙනෙනා
ඇසළ මහේ මේ ගනඳුරු හද නිවනා

අඳුර අරක්ගත් අවිදුර මහ දවනේ
සෙව්වා කුමරුන් එළි කරණා කිරණේ
හවදුර දුක නිවමින් සදනා සෙත නිවනේ
උතුම් බුදු බවමයි ඔබෙ හද තුළ රැඳුනේ

මහත් විකුම් පෙළක් අද දින වල ලෙසට
පැවසුවා අසල මගෙ සඳ රැස් වගුල කොට
මතු සක්විති රජ වන බව කී බමුණන් පළමු කොට
කළකිරුණා මුල් සසරම පින්බර කුමරු හට

නිදනා සිරි යහන් කුළේ තම අඹු යශෝදරා
ඒ යහනේ තුරුලු වී නිදනා තම පුත් බිළිඳුන් කුමරා
තද වු බන්ධනයක් ලෙසින් දැනුණේ සසර පුරා
මිදිය යුතුය නොවේද කෙලෙස හෝ ගලවා උදුරා

වේගයෙන් ගැහෙනා සිදුහත් හද ගැස්මේ
දුවනා කන්ථක අසු ඔහු රැගෙනම එන හැල්මේ
සැණෙකින් නතර වුවා නොව නේරංජන ගඟ ගැල්මේ
සිදුවන අසිරිය නිම දෝ මේ එන පිම්මේ

ඉපිද මැරෙන යළි ඉපිදෙන මේ දනන් වෙත
දිය යුතු නොවේද සනසා සිත් දහම් මෙත
සිදුහත් කුමරු දියතෙහි බැදි කුලුණු සිත
පෙරදැරි කරන් අභිනිෂ් කළේ බුදු බව පතා වෙත

10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.එල්.ඒ. නිලංජි හර්ෂිකා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

නිළඹරේ දිලුන හිරු ගොම්මනේ බැස යාවී
මරණයට දිනෙන් දින නොදැනිම ලංවේවී
ඒ බවක් නොදැන අපි තව තවත් මුලාවී
කම්සපට ගිජුව සංසාරයක් හදාවී

දන්නෙ නෑ කොහේ සිට ආවේද යැයි කියා
දන්නේ නෑ මෙහෙන් කොහෙ යන්නේ ද යැකි කියා
රසයි සැපයයි කියා ඇලෙනවා ඇලෙනවා
නොදනීද මේ සසරේ සැරිසරනවා කියා

කකා බී හැදපැලඳ සේවයක නිරත වී
පැනැති දරු පරපුරක් රටට දායාද දී
කාටවත් වැරැද්දක් නොකර ජීවත් වෙවී
ගෙවූ දිවි ගමන හොඳමුත් සසර දිග වැඩී

රකින සතුටක් ගෙනෙන දෙයක් නැත සසර තුළ
දකින විඳිනා සියල්ලම නිත්‍ය නැත මෙපිට
ක්ෂණයකින් වෙනස්වෙයි මෙලොව අප විඳින සැප
නොවෙනස් ව ඇත දෙයක් එය වෙනස්වීමය

පසිඳුරන් පිනූ ගත සතුට සොයමින් යාවී
දිනෙක ඒ හැම දමා මේ භවෙන් නික්මේවී
මතුභවය කෙබඳු දැයි බියක් මතු වී ඒවී
රසට විඳි ජීවිතය තිත්ත යැයි තේරේවී

දුෂ්කරයි දුක්ඛිතයි බයකරුයි මේ සසර
නිශ්චිතව කිව නොහැක ඉපදෙනා භව කවර
සසරින් එතෙර වන්න භව දුක නිවාලන්න
නිවන පමණයි අපට මෙලොව ඇති එකම මඟ

12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දිනුෂි තක්ෂිලා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## පැතුමක්...

ගත වෙහෙසා - මනස යොදා
ඔබ උපයන ධනයෙන්
කොටසක් මා වෙත පිදුමට
නිර්ලොභී වූ මවුණි -
පියාණෙනි,

පෙර කළ පින් බලෙන්
ලැබුවා මිනිසත් භවයක්
මේ කරනා පුණ්‍ය බලෙන්
ලැබේවා දෙව් සම්පත්

වෙහෙසෙනා ගතට දිරියත්
වෙහෙසෙනා මනසට සුවයක්
උපනා ධනයට වැඩි එකතුවක්
ලැබේවා'යි දින දින
පතන්නම්....

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන රුවන්දි චතුෂ්කා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## වෙසක් එළිය...

අහස පුරා සඳ පායා
තරු පිපිලා එළිය ගොඩයි

පොළොව වසා වෙසක් පහන්
විදුලි බුබුළු එළිය ගොඩයි

අහස පොළොව එකතු වෙලා
මුළු ලෝකෙම එක එළියයි

බුදු තෙමඟුල සිදු වුණ දා
තුන් ලෝකෙම එළිය වුණයි

තුන් ලෝකෙට පහනක් වූ
බුදු සමිඳුව සිහි කරමු

දම් පහණින් නැණ පහනක්
දල්වා එළියක් ලබමූ.

10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඊ.ඒ. කලණ හසරංග පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

## කැපකරු අම්මේ තාත්තේ...

මහමෙර උසුලනා මේ මිහිකතටත් වැඩිය
දරු දුක උහුලනා මව අති උතුමන්ය
දරුවන් සුදනන් කිරීමට ඇති දුක වැඩිය
මතු බුදු වන්න මගේ ආදර අම්මා.....

දහඩිය බිඳු පොළොවට දුන් මගෙ ආදර පියාණෙනි
පොළොවින් මිණි කැට ගත් මගෙ ආදර පියාණෙනි
දුකසේ සෙවූ රන් කහවණු පිනට දුන් මගෙ ආදර පියාණෙනි
මතු බුදු වන්න මගෙ ආදර පියාණෙනි.....

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඒ.බී.කේ. චංචලා තාරුණ්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

මහ සයුරෙහි රුවල් නැවක් මෙන්
වැලි කතරෙහි ක්ෂේම භූමිය මෙන්
නොනිමි දල්වෙන පහන් ආලෝකය
ඔබය.......
කිසිදා මා අත් නොහරින
මාගේ ආදරය,
ඔබය....'ශ්‍රද්ධා'
මගක් පෙන්වූවා දැන් දිගුකර
අධ්‍යාපනය නම් එල නෙලීමට
මෑණියනි....
පියාණෙනි....
හැකි වේවි නොඅනුමානයි
මා හට,
මිහිරි එල නෙළාගැනීමට
කඩයිම් රැසක් පසුකොට
යන්න සරසවි පුද බිමට
නුඹගේ ම දුවෙකු මෙන්
නැණ පහන් දල්වන්නට
මට දිරිය දුන්
රුකුල් වූ ඔබ සැමට
නිතැතින් ම පුදමි තුති
දැන් එක්කොට....

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එච්.එම්.එස්. මධුවන්ති
දියණිය විසින් එවූ නිර්මාණයක්....

**ඉගෙනීමට වෙරදරන අපහට දිරිදෙන ශ්‍රද්ධාවන්ත ඔබ සියලුදෙනාහට ම උපහාරයක් ම වේවා!...**

දිරියෙන් නිති ඉගෙනුමට වෙහෙසෙනා
අපහට හැමවිට පිහිටවෙනා
දිනපතාම බුදු දහමින් අපව අමතනා
ශ්‍රද්ධා නම් නාමය මුළු ලොව ම බබළනා

තිළිණයක් ලැබුණි මා හට ඔබගෙන්
ශිෂ්‍යත්වයක් විය එය පවසන අයුරින්
සිසුවෙක් ලෙස මා හට කළ හැකි අයුරින්
තුතියක් පුදමි ඔබහට මෙලෙසින් සතුටින්

නිතරම පොත පතටම කැප වෙමි
ඉගෙනීමෙන් ඉදිරියට ම යන්නෙමි
බුදු දහමට අවනත වී හිඳිනෙමි
යහපත් දරුවෙකු වී ලොව බබළමි.

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.ඩබ්. සරෝජා ජයමිණී දියණිය විසින් එවූ නිර්මාණයක්....

## අරුත් තේරුම් ගනිමින් මිහිරට සජ්ඣායනා කරන්න

# ධම්මචක්කප්පවත්තන සුත්තං

(දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව)

**ඒවං මේ සුතං. ඒකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනේ මිගදායේ. තත්‍ර ඛෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛූ ආමන්තේසි.**

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් මිගදායේ වැසවසන සේක. එකල්හී භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් අමතා මේ ධම්මචක්ක දේශනය වදාළ සේක.

**ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා.**

පින්වත් මහණෙනි, පැවිද්දන් විසින් සේවනය නො කළ යුතු වූ මේ අන්ත දෙකකි.

**යෝචා'යං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

යම් මේ කාමයන්හී කාම සුඛයේ ඇලී ගැලී වාසය කිරීමක් ඇද්ද මෙය හීන වූ දෙයකි, ලාමක වූ දෙයකි, පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි, උත්තම මිනිසුන් විසින් සේවනය නො කරන දෙයකි, අනර්ථ සහිත දෙයකි.

**යෝචා'යං අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

පින්වත් මහණෙනි, යම් ඒ තමා ව පීඩාවට පත් කරවන වැඩ පිළිවෙලක් ඇද්ද, එය දුක් සහිත දෙයකි, උත්තම මිනිසුන් විසින් සේවනය නො කරන දෙයකි, අනර්ථ සහිත දෙයකි.

**ඒතේ තේ භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදී. මේ මධ්‍යම ප්‍රතිපදාව දහම් ඇස ලබා දෙයි. නුවණ උදා කරයි. සංසිඳීම ඇති කරයි. විශේෂ ඤාණය ඇති කරයි. නිවන පිණිස පවතින්නේ ය.

**කතමා ච සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති?**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, අවබෝධය ඇති කරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක් ද?

**අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.**

ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ය. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා ද, සම්මා කම්මන්තය ද,

සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද, සම්මා සමාධිය ද යන මෙය යි.

**අයං ඛෝ සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, අවබෝධය ඇති කරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙය යි.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛං අරියසච්චං. ජාති'පි දුක්ඛා ජරා'පි දුක්ඛා ව්‍යාධි'පි දුක්ඛෝ මරණම්පි'දුක්ඛං අප්පියේහි සම්පයෝගො දුක්ඛෝ පියේහි විප්පයෝගො දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි. ඉපදීම ද දුකකි. ජරාවට පත් වීම ද දුකකි. රෝග පීඩා වැළඳීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයින් හා අප්‍රිය වස්තූන් සමඟ එක්වීම ද දුකකි. ප්‍රිය පුද්ගලයන් හා ප්‍රිය වස්තූන් ගෙන් වෙන් වීම ද දුකකි. කැමති වන්නා වූ යම් දෙයක් ඇද්ද, එය නො ලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත් පංච උපාදානස්කන්ධයෝ ම දුකකි.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛසමුදයං අරියසච්චං. යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනි. සෙයාථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. පුනර්භවය ඇති කරන, ආශ්වාදයෙන් ඇලෙන්නා වූ, ඒ ඒ තැන සතුටින් පිළිගන්නා වූ යම් ඒ තණ්හාවක් ඇද්ද, එය යි. එනම්, කාම තණ්හාව ය, භව තණ්හාව ය, විභව තණ්හාව ය.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං. යෝ තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. ඒ තණ්හාවේ ම ඉතිරි නැතිව නො ඇල්මෙන් නිරුද්ධ වීමක් වේ ද, දුරු වීමක් වේ ද, තණ්හාවෙන් මිදීමක් වේ ද, ආලය නැතිවීමක් වේ ද එය යි.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං. අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදංඃ සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ය. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා ද, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද, සම්මා සමාධිය ද යන මෙය යි.

**ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ භිකඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි. ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ වියි ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරන ලදි යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මෙ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඥාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීණන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඥාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය වූයේ යයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඥාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය සාක්ෂාත් කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය සාක්ෂාත් කරන ලදි යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඥාණං උදපාදි පඥ්ඥා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං භාවිතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඥාණං උදපාදි පඥ්ඥා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කරන ලදි යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**යාවකීවඤ්ච මේ භික්ඛවේ, ඉමේසු චතුසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඥාණදස්සනං න සුවිසුද්ධං අහෝසි. නේවතාවා'හං භික්ඛවේ, සදේවකේ**

**ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

පින්වත් මහණෙනි, චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසකින් යුතුව සැබෑ තත්වය නම් වූ ඤාණ දර්ශනය සුවිශුද්ධ ලෙස මා හට යම් තාක් අවබෝධ නො වූයේ වේ ද, ඒ තාක් කල් ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයේ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි. යි ප්‍රතිඥා නො දුන්නෙමි.

**යතෝ ච බෝ මේ භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි. අථා'හං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

යම් කලෙක පින්වත් මහණෙනි, මා හට චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසකින් යුතුව සැබෑ තත්වය නම් වූ ඤාණ දර්ශනය සුවිශුද්ධ ලෙසට ම අවබෝධ වූයේ වේ ද, ඒ තාක් කල් ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයේ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි යි ප්‍රතිඥා දුන්නෙමි.

**ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි අකුප්පා මේ චේතෝ විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ'ති.**

මා හට ඤාණ දර්ශනය පහළ විය. මාගේ චේතෝ විමුක්තිය වෙනස් නො වන්නේ ය. මෙය වනාහී අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ ය.

**ඉදමවෝච භගවා. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ක දේශනය වදාළ සේක. අතිශයින් ම සතුටට පත් වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද මේ ශ්‍රී සද්ධර්මය මහත් සොම්නසින් යුතුව පිළිගත්තාහු ය.

**ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මන්'ති.**

මේ ධම්මචක්ක දේශනය වදාරණ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා වූ යම් දෙයක් ඇද්ද, හේතූන් නිරුද්ධ වීමෙන් ඒ සියල්ල ම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්ත යයි කියා කෙලෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

**පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ භුම්මා දේවා සද්දමනුස්සාවේසුං. ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්'ති.**

අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට

හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම යයි කියා පොළොවවාසී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං....**

පොළොවවාසී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**චාතුම්මහාරාජිකානං දේවානං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං....**

චාතුම්මහාරාජික දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා තාවතිංස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං.....**

තාවතිංස දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා යාම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං.....**

යාම දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා තුසිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං....**

තුසිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා නිම්මාණරතී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තිනෝ දේවා සද්දමනුස්සාවේසුං.....**

නිම්මාණරතී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා පරනිම්මිතවසවත්තී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං.....**

පරනිම්මිතවසවත්තී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්මපාරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං.....**

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දේවා සද්දමනුස්සාවේසුං....**
බ්‍රහ්ම පුරෝහිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා මහා බ්‍රහ්ම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**මහාබ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා පරිත්තාභා දේවා සද්දමනුස්සාවේසුං....**

මහා බ්‍රහ්ම දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**පරිත්තාභානං දේවානං සද්දං සුත්වා අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං....**

පරිත්තාභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා අප්පමාණාභ දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

**අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං....**

අප්පමාණාභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා ආභස්සර දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

**ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං....**

ආභස්සර දෙවියන් ගේ දහම් සෝෂාව අසා පරිත්තසුභ දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

**පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං....**

පරිත්තසුභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා අප්පමාණසුභ දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

**අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං....**

අප්පමාණසුභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා සුභකිණ්හ දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

**සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං....**

සුභකිණ්හ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා වේහප්ඵල දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**වේහප්ඵලානං දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං....**

වේහප්ඵල දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා අවිහ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං....**

අවිහ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා අතප්ප දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං....**

අතප්ප දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා සුදස්ස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං....**

සුදස්ස දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා සුදස්සී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

**සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං. ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්'ති.**

සුදස්සී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම යයි කියා අකනිට්ඨ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්තුවාහු ය.

**ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගඤ්ඡි. අයඤ්ච දසදහස්සී ලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි.**

ඒ ක්ෂණයෙහි ම, ඒ මොහොතෙහි ම, බ්‍රහ්ම ලෝක යම් තාක් වේ ද, ඒ තාක් ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේ ය. දස දහසක් ලෝක ධාතුව ම කම්පා විය. තදින් ම කම්පා විය. බලවත් ව කම්පා විය.

**අප්පමාණෝ ච උළාරෝ ඕභාසෝ ලෝකේ පාතුරහෝසි අතික්කම්ම දේවානං දේවානුභාවන්'ති.**

දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණ වූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේ ය.

**අථ ඛෝ භගවා උදානං උදානේසිඃ**

එකල්හී භාග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළාහු ය.

**අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝති.**

භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා.
භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා.

**ඉතිහිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤෝත්වේව නාමං අහෝසි'ති.**

මේ ආකාරයෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට අඤ්ඤාකොණ්ඩඤ්ඤ යන මේ නාමය ඇති වූයේ ය.

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**
මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!

**ඵන්දනං චපලං චිත්තං - දුරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරෝති මේධාවී - උසුකාරෝ'ව තේජනං**

හිත කියලා කියන්නේ අරමුණක් පාසා
සැලෙන දෙයක්. චපල දෙයක්. රැකගන්නට අමාරු දෙයක්.
වරදින් වළක්වන්ටත් අමාරු දෙයක්.
නමුත් බුද්ධිමත් කෙනා (ධර්මයේ පිහිටලා)
එබඳු සිත පවා ඍජු කරගන්නවා.
ඇද කුද හැරලා ඊ දණ්ඩක් ඍජු කරන හී වඩුවෙක් වගේ.

**වාරිජෝ'ව ථලේ ඛිත්තෝ - ඕකමෝකත උබ්භතෝ**
**පරිඵන්දතිදං චිත්තං - මාරධෙය්‍යං පහාතවේ**

වතුරෙන් ගොඩට ගත්ත මාළුවෙක් දඟලනවා වගේ
මේ හිත අරමුණෙන් අරමුණට දඟල දඟල තියෙන්නේ.
එබඳු සැලෙන සිතකින් යුක්ත නිසා,
සකස් වෙලා තියෙන මේ උගුල දුරුකරන්ටමයි ඕනෙ.

(සැවැත් නුවරදී එක්තරා භික්ෂුවක් අරහයා වදාළ ගාථාවකි.)
ධම්ම පදය - චිත්ත වර්ගය

©2018 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV